


**ලාංකේය සුභාවිත ගීතයේ නිම් වළලු ප්‍රසාරණය කල ප්‍රවීණ ගායන ශිල්පී සුනිල් එදිරිසිංහයන්ගේ නවතම ගීත එකතුව "මල් වැහි පොද" ගීත ඇලබමය එළි දැක්වීම නිමිත්තෙනි.**

*මල් වැහි පොදට ආරාධනා*
*ඉවරයි අසනි හෙණ ගර්ජනා*
*නිල් දෙරණ මල් යහනක් කරන්නට*
*මල් වලට ආරාධනා.....*



"

හැම ක්ෂේත්‍රයක් ම අළලා ලියවුනු ප්‍රවීණ සහ නව පරපුරේ රචකයන්ගේ ගී පද රචනා අපට ලැබිල තියෙනවා. ඒ වගේම තනු නිර්මාණයේදීත් ප්‍රවීණ සහ නව පරපුරේ ශිල්පීන්ගේ නිර්මාණ දායකත්වය අපට ලැබිල තියෙනවා.

ගී පද රචනා පැත්තෙන් කුමාරතුංග මුනිදාස ශූරීන්, රත්න ශ්‍රී විජේසිංහ, කුමාරදාස සපුතන්ත්‍රී, බන්දුල නානායක්කාරවසම්, ගයාරම්‍ය අල්විස්, යමුනා මාලනී පෙරේරා, සමුද්‍ර වෙත්තසිංහ, කිරම සුමංගල හිමි, සමිත ආර්. ලියනගේ, නෙල්සන් දේමුණි ආදීන් දායක කරගනු ලැබුවා.

සංගීත නිර්මාණය පැත්තෙන් රෝහණ වීරසිංහයන්ගේ තනු නිර්මාණ වැඩි ගණනක් මෙහි ඇතුලත්. ඊට අමතරව එච්. එම්. ජයවර්ධන, නවරත්න ගමගේ, සුනිල් දයානන්ද කෝනාර, ආනන්ද ගමගේ, කරුණාරත්න විජේවර්ධන, ආනන්ද පෙරේරා, නාලක අංජන කුමාර, මහානාම වික්‍රමසිංහ, දර්ශණ රුවන් දිසානායක සහ අසේල දිසානායක නිර්මාණය කල මධුර තනු රැසක්ම මෙහි ඇතුලත්. මට මෙම ගීත ඇල්බමය සඳහා යුග ගායනයෙන් සහය වූයේ ප්‍රදීපා ධර්මදාස සහ රශ්මි සංගීතා යන ශිල්පිණියන් දෙදෙනායි.

මෙහි විශේෂත්වය වන්නේ මිනිසුන් අතර ඉතාම ප්‍රචලිත "මේ තරම් සියුමැලිද කළුගල්" කියන ගීතයත් මේ සංයුක්ත තැටියට ඇතුලත් වීමයි.

ඒ වගේම වර්තමාන තරුණ නිර්මාණ කරුවන්ගේ දායකත්වය හොඳ නිර්මාණ බිහි කිරීමට ලබා ගැනීම තමයි මගේ බලාපොරොත්තුව කියන දේ කිව යුතුයි. "

**"මල් වැහි පොද" ගීත ඇලබමය එළි දක්වන සැප්තැම්බර් පළමුවැනිදා තමා සමග එක්වන්නට කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයට එන ලෙස සිය සහෘද රසිකයන්ට ආරාධනා කල සුනිල් එදිරිසිංහයන් මේ ගීත එකතුව මෙතෙක් මා ආ ගී මග වෙනස් කරන නැවුම් කඩඉමක් වේ යැයි අප සමග පැවසුයේ බලාපොරොත්තු පිරුණු දෑසින්.**

සංවාද සටහන - තිවංක උඩගෙදර
ඡායාරූප - සිසිර විජේතුංග